# කොවිඩ් 19 - සති පාසල 10 ශ්‍රේණිය

## 9 වන පාඩම - පුනරුදය

සැකසුම - M.P.A ප්‍රදීප් කුමාර                                        කෑ / දෙහි කිතලංගමුව ක . වි

### විද්‍යාත්මක පුනරුදය හා දේශපාලන නවෝදය

- නිපුණතාවය - ඓතිහාසික භූගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය විමසා බලා තම උරුමය සහ අනන්‍යතාවය රැක ගනිමින් ලෝක ප්‍රවණතාවලට මුහුණදීමේ ශක්තිය ඇති කර ගනී.
- නිපුණතා මට්ටම - 9 . 1 යුරෝපයේ ඇති වූ පුනරුදයේ ඓතිහාසික පසුබිම විමර්ශනය කරයි.
- විෂය සන්ධාරය / පාඩම - යුරෝපයේ පුනරුදය

- ඉගෙනුම් ඵල -
    - පුනරුදයට හේතු දක්වයි.
    - යුරෝපය වෙනස්වීමට පුනරුදය බලපෑ ආකාරය පෙන්වා දෙයි.

(3) ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

දුවේ පුතේ ඔබ 8 ශ්‍රේණියේ දී යුරෝපයේ පුනරුදය හා දේශ ගවේශන ව්‍යාපාරය සම්බන්ධයෙන් අධ්‍යනය කරනු ලැබූහ. අප මෙම පාඩමෙන් යුරෝපයේ පුනරුදය සහ එහි සුවිශේෂී අංග ලක්ෂණ පුනරුදයේ ව්‍යාප්තිය සහ බලපෑම් පිළිබඳව තවත් ගැඹුරින් සහ විස්තරාත්මකව අධ්‍යනය කරමු. ඔබ කළින් ශ්‍රේණියේ දී ඉගෙනගත් දැනුමක් ඒ ඔස්සේ ලබා ගත් අවබෝධයක් සමග මෙම පාඩමේ එන කරුණු ද අධ්‍යනය කරමින් විස්තරාත්මක අවබෝධයක් සමග මෙම පාඩමේ එන කරුණු ද අධ්‍යනය කරමින් විස්තරාත්මක අවබෝධයක් ලබා ගන්න.

මේ අනුව ඔබ 8 ශ්‍රේණියේ පෙළ පොතක් 10 ශ්‍රේණියේ පෙළ පොතේ හොඳින් අධ්‍යනය කර පහත ක්‍රියාකාරකම්වල යෙදෙන්න.

(1) විද්‍යාත්මක පුනරුදය යටතේ විශ්වය පිළිබඳව සිදු කළ නව සොයා ගැනීම් හා ඒවා සිදු කළ පුද්ගලයන් කවුරුන් ද?

(2) පුනරුද සමයේ යුරෝපයේ වෛද්‍ය විද්‍යාව තුළ ඇති වූ නව වර්ධනයන් මොනවා ද?

**(3) මධ්‍යතන යුගයේ සහ පුනරුද සමයේ යුරෝපයේ දේශපාලන ක්ෂේත්‍රය තුළ දක්නට ලැබුණු ප්‍රධාන ලක්ෂණ වගුවක් සටහන් කරන්න.**

| දේශපාලන ක්ෂේත්‍රයේ පුනරුදය | |
|---|---|
| මධ්‍යතන යුගයේ දේශපාලනික තත්වය | පුනරුද සමයේ දේශපාලන නවෝදය |
| | |

- ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාරී කර ගත හැකි පොත්පත් , වෙබ් අඩවි හා ඉගෙනුම් ආධාරක .
  දුවේ පුතේ ඔබට පහත සඳහන් වෙබ් අඩෙවි බැලීමෙන් සහ පහත පොත්පත් කියවීමෙන් මෙම පාඩමට අදාල තවත් තොරතුරු එකතු කරගැනීමට පුලුවන් .
  1) e - තක්සලාව
  2) e - නැණ පියස - http:/ www. enenapiyasa.lk
  3) You tube නාලිකාවේ යුරෝපයේ පුනරුදයට අදාල මාතෘකා සඳහා ඇති තොරතුරු , රූප සටහන් හා සිතියම් ආදිය
  4) පොත්පත් - 8 ශ්‍රේණිය සහ 10 ශ්‍රේණිය පෙළපොත් - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව
     අ . පො . ස ( උ . පෙළ ) යුරෝපා ඉතිහාසය පෙළපොත - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව
     යුරෝපා ඉතිහාසයේ මධ්‍යකාලීන යුගය පිළිබඳ විමසුමක් - ගාමිණී පලිහේන